# අභිණ්හ ජාතකය

තවද එක්සමයෙක්හි බුදුරජානන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩවසන සේක් එක් උපාසකයකු හා මහළු තෙරුණුකෙණකුන් අරභයා මේ ජාතකය වදාළ සේක. සැවැත්නුවර වාසයකරන්නා වූ යහළුවෝ දෙදෙනෙක් වූවාහුය. ඔවුන් අතුරෙහි එක් කෙණෙක් පැවිදිව දවසක් දවසක් පාසා උපාසකයාගේ ගෙට වඩනා සේක. උපාසක තෙමේ තෙරුන්වහන්සේට ආහාර පිළිගන්වා තෙමේද ආහාර අනුභවකොට උන්වහන්සේ හා සමග විහාරයට අවුත් සූර්යයා අස්තාංගවන තැන් දක්වා ඔබිනොබ කථා කිරීමෙන්ද හිඳ නුවරට යන්නේය.  තෙරුණ් වහන්සේද නුවර වහසල් දොර දක්වා ඒ උපාසිකයා එක්ව ගොස් නවත්නාසේක. ඒ දෙදෙනා විශ්වාස බව භික්ෂූන් වහන්සේ අතුරෙහි ප්‍රකාශ වූයේය. ඉක්බිත්තෙන් එක් දවසක් භික්ෂූහු ඔවුන් දෙදෙනා ගේ විශ්වාස කථාව කියමින් දම්සභාමණ්ඩපයෙහි උන්නාහුය. සර්වඥයන් වහන්සේ වැඩවදාරා මහණෙනි. මේ දම්සභා මණ්ඩපයෙහි උන්නාහුය. සර්වඥයන් වහන්සේ වැඩවදාරා මහණෙනි මේ දම්සභාවෙහි දැන් මා එන්නට පූර්ව භාගයෙහි කවර නම් කථාවකින් යුක්තව උන්නාහුදැයි විචාරා ස්වාමීන් වහන්ස මේ නම් කථාවකිනැයි දනු වූ කල්හි සර්වඥයන් වහන්සේ වදාරණ සේක් මහණෙනි. මොහුන් දෙදෙන විශ්වාස වූවෝ දැන් මතු නොවෙයි පෙරත් විශ්වාස වූවාහුයයි වදාරා ඉකුත්වත් දක්වා වදාළ සේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරණ කල්හි අප මහා බෝසතානන් වහන්සේ ඒ රජහට අමාත්‍යයෙක් වූ සේක. එකල්හි එක් සුනඛයෙක් මගුල් ඇත්හලට ගොස් මගුල් ඇතා අනුභව කරණ තන්හි වැටුනා වූ බත්හුළු අනුභව කරන්නේය. ඒ සුනඛතෙම ඒ ආහාරයෙන්ම වැඩෙනු ලබන්නේ මගුලැතාට විශ්වාස වූයේය. සුනඛයා හස්තියාගේ සමීපයෙන්ම අනුභව කරන්නේය. දෙදෙනාම වෙන්ව වසන්නට නොහැකි වෙති. සුනඛතෙම හස්තියාගේ සොඬ ගෙණ ඔබිනොබ කෙරෙමින් කෙළනේය. එසේ කල්හි එක් දවසක් පිටිසර වැසි එක් ග්‍රාමික මනුශ්‍යයෙක්  ඇත්ගොව්වාට මිලදී ඒ සුනඛයා ගෙණ තමාගේ ගමට ගියේය. එතැන් පටන් ඒ හස්තියා සුනඛයා නොදක්නේ ගොදුරු නොම අනුභව කරන්නේය. පැන් නොබොන්නේය. නොම නහන්නේය. ඒ කාරණය රජහට දැන්වූවාහුය. රජ්ජුරුවෝ බෝධිසත්වයන් වහන්සේට වදාරණ සේක් යව පණ්ඩිතයෙනි දැනගණුව කවර කාරණයකින් හස්තිරාජ තෙම මෙලෙස කරන්නේ දැයි කියා යැවූ සේක. බෝධිසත්වයන් වහන්සේ හස්තිශාලාවට ගොස් හස්තියාගේ දොම්නස් බැව් දැන මොහුගේ ශරීරයෙහි රෝගයක් නොපෙණෙන්නේය. මොහුගේ වනාහී කිසිකෙණෙකුන් හා සමග මිත්‍රසන්තවයක් විය යුතුයයි ඔහු නොදක්නේ මේ තෙමෙ ශොකයෙන් මඩනාලද්දේවනැයි සිතා හස්ත්‍යාචාර්යයා අතින් විචාරණසේක් මොහුගේ කිසිකෙනෙක් හා සමග විශ්වාස බවක් ඇද්දෝහෝයි විචාළ සේක. ස්වාමීන් වහන්ස එසේය. එක් සුනඛයෙකු හා එක්ව බලවත් මිත්‍රකමක් ඇත්තේය යි කීය. දැන් ඒ සුනඛයා කොයිදැයි විචාළසේක. එක් මනුශෂයෙකු විසින් ගෙණ යන ලද්දේය. ඔහු වාසය කරණ තැන් දන්නේ දැයි කී සේක. ස්වාමීන් වහන්ස. නොදනිමි කීහ. බෝධිසත්වයන් වහන්සේ රජුගේ සමීපයට ගොස් මහරජ්ජුරුවන් වහන්ස හස්තියාට කිසි ආබාධයක් නැත්තේය. ඕහට වනාහී එක් සුනඛයෙකු හා සමග බලවත් විශ්වාසයක් වූයේය. ඒ සුනඛයා නොදක්නා  වූ හස්තිරාජ තෙම භෝජනය අනුභව නොකෙරෙයි සිතමියි කියා මෙසේ කීසේක. මහරජ බතට පළමු කොට දෙන කටුක භෛෂජ්‍යයෙන් යුක්ත යුක්ත පිඬුගන්නට නොපොහොසත. පිඬු කොට දෙන භොජනය ගන්නට නොපොහොසත. කුශතෘණ ද අනුභව කරන්නට නෝද පොහොසත. නහන වේලෙහි ශරීරාවර්තනය කරන්නටද නොපොහසත, නිරන්තර දර්ශනය හේතු කොට ගෙණ හස්තිරාජ තෙම සුනඛයා කෙරහි සෙනහකෙළේයයි සිතමියි කී සේක. මෙසේ යමක් යමක් ඒ හස්තිරාජයාකරන්නට නොහැකිද ඒ සියල්ලම රජහට දැන්වූ සේක. රජ්ජුරුවෝ බෝධිසත්වයන් වහන්සේගේ වචනය අසා පණ්ඩිතයන් වහන්ස දැන් කවරක් කටයුතු දැයි විචාළසේක. අපගේ මගුලැතාගේ යහළු සුනඛ තෙම එක් ගම්වැසි මනුශ්‍යයෙක් ගෙණ ගියේය. යමක්හුගේ ගෙයි ඒ සුනඛයා දුටුවොත් ඕහට මේ බඳු දඬයක් කියා බෙර ලව මහරජයි කීසේක. රජතෙම එලෙස කරවූයේය. ඒ ප්‍රවෘත්තිය අසා ඒ පුරුෂතෙම සුනඛයා හැරියේය. සුනඛතෙම සීඝ්‍රයෙන් ගොස් හස්තියාගේ සමීපයටම ගියේය. හස්ති තෙමෙ සුනඛයා සොඬින් ගෙණ කුම්භස්ථලයෙහි තබා හඬා වැලප පියා කුම්භස්ථලයෙන් බස්වා ඔහු විසින් ආහාරය අනුභව කළ කල්හි පසුව තෙමේ අනුභව කෙළේය. තිරශ්චීනයාගේ අභිප්‍රාය දත්තේයයි කියා රජ්ජුරුවෝ බෝධිසත්වයන් වහන්සේට මහත් ඓශ්චර්ය දුන්සේක. ශාස්තෲන් වහන්සේ වදාරණ සේක් මහානෙනි. මොහු දෙදෙන විස්වාසවූවෝ දැන් මතු නොවෙයි පෙරත් විස්වාසවූවාහුයයි කියා මේ ධර්මදේශනාව ගෙණ හැර දක්වා චතුස්සත්‍ය දේශනාව වදාරා පූර්වාපර සන්ධි ගළපා මේ අභිණ්හ ජාතකය නිමවා වදාළ සේක. මේ චතුස්සත්‍ය  දේශනාව කිම සියලු ජතකවල ම ඇත්තේය. අපි වනාහි චතුස්සත්‍යය යහ් තැනෙක්හි ආනිසංස පෙණේද එතැන්හි දක්වමු. එසමයෙහි සුනඛතෙමෙ දැන් මේ උපාසක වූයේය. හස්ති තෙම දැන් මේ මහල්ලක ස්ථවිර වූයේය. පණ්ඩිත අමාත්‍යව උපන්නෙම් වනාහි තිලෝගුරු සම්‍යක් සම්බුදු රජ වූ මමම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළ සේක.